සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Southern Provincial Department of Education

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, තෙවනවාර පරීක්ෂණය, 2022 ජනවාරි
## General Certificate of Education (Adv. Level), Grade 13, Third Term Test, January 2022

භෞතික විද්‍යාව I
Physics I

01 S I

පැය දෙකයි
Two hours

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. $P = \frac{RT}{V-b} - \frac{a}{V^2}$ සමීකරණයේ $R$ මාන රහිත නියතයකි. $V$ පරිමාව ද, $P$ පීඩනය ද $a$ හා $b$ නියත ද වේ. $a/b$ මගින් නිරූපණය වන භෞතික රාශිය වන්නේ,

   1). පීඩනය 2). ශක්තිය 3). බලය 4). ක්ෂමතාවය 5). ගම්‍යතාවය

2. බලය, කාර්යය හා ක්ෂමතාවය යන රාශීන් මූලික ඒකක මගින් නිවැරදිව නිරූපණය වන ආකාරය පිළිවෙලින් දක්වා ඇත්තේ,

   1). $kg\, m\, s^{-2},\ kg\, m^2 s^{-2},\ kg\, m\, s^{-3}$
   2). $kg\, m^2\, s^{-3}\ ,\ kg\, m^2 s^{-2},\ J\, s^{-1}$
   3). $kg\, m\, s^{-2},\ kg\, m^2 s^{-2},\ kg\, m^2\, s^{-3}$
   4). $N\ , N\, m,\ W$
   5). $kg\, m^2\, s^{-3}\ ,\ kg\, m^2 s^{-2}, W$

3. සෘජු මාර්ගයක ඒකාකාර ත්වරණයකින් ගමන් කරන මෝටර් රථයක් එකිනෙකට $60\, m$ දුරකින් ඇති ලක්ෂ්‍ය දෙකක් අතර දුර යාමට $10\, s$ කාලයක් ගනී. දෙවන ලක්ෂ්‍යය පසුකර යන විට වේගය $7\, m\, s^{-1}$ ක් වේ. පළමු ලක්ෂ්‍යය පසුකර යන වේගය කුමක් ද?

   1). $6\, m\, s^{-1}$ 2). $5\, m\, s^{-1}$ 3). $7\, m\, s^{-1}$ 4). $10\, m\, s^{-1}$ 5). $5\, m\, s^{-1}$

4. එකිනෙකට $100\, cm$ ඈතින් පිහිටි දීප්ත වස්තුවක් සහ තිරයක් අතර නාභිය දුර $25\, cm$ වන තුනී උත්තල කාචයක් තබා කාචයේ පිහිටීම වෙනස් කිරීම මගින් තිරය මත ලබාගත හැකි ප්‍රතිබිම්බ පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

   1). ප්‍රතිබිම්බ දෙකක් වන අතර ඒවා යටිකුරුය.
   2). ප්‍රතිබිම්බ එකක් වන අතර එය යටිකුරුය.
   3). ප්‍රතිබිම්බ එකක් වන අතර එය උඩුකුරුය.
   4). ප්‍රතිබිම්බ දෙකක් වන අතර ඒවා උඩුකුරුය.
   5). ප්‍රතිබිම්බ සංඛ්‍යාව ශුන්‍ය වේ.

5. අතාත්වික වස්තුවක් සඳහා තුනී අවතල කාචයකින් සෑදෙන ප්‍රතිබිම්බය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.

   A). සෑම විටම අතාත්වික වන අතර වස්තුවට වඩා කුඩා එකකි.
   B). අතාත්වික වන අතර වස්තුවට වඩා කුඩා විය හැකිය.
   C). තාත්වික වන අතර වස්තුවට වඩා විශාල වේ.

   ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

   1). $A$ පමණි 2). $B$ පමණි 3). $A, B$ පමණි
   4). $B, C$ පමණි 5). $A, B$ හා $C$ සියල්ලම

6. රූපයේ පරිදි සුමට කප්පියක් මතින් යවන ලද ඒකාකාරී බර තන්තුවක් තිරසට $\sin^{-1}(1/3)$ ක කෝණයක් ආනත සුමට තලයක සමතුලිතතාවයේ පවතී. ආනත තලය මත ඇති තන්තු කොටසේ උපරිම දිග කොපමණ ද?




1). 4 2). 12 3). 8
4). 6 5). 10

7. රූපයේ ආකාරයට වාතය තුල ඇති $O$ ලක්ෂ්‍යයීය වස්තුවක් දෙස ඒකාකාර ඝනකම පතුලක් සහිත ජලය පිරවූ වීදුරු බඳුනක් හරහා සිරස්ව ඉහළින් නිරීක්ෂණය කරයි. $O$ හි ප්‍රතිබිම්බය පිහිටනුයේ, ( ජලයේ සහ වීදුරු වල වර්තනාංක පිළිවෙලින් $\frac{4}{3}$ සහ $\frac{3}{2}$ වේ.)




1). $AB$ ට $4\,cm$ පහළිනි.
2). $AB$ පෘෂ්ඨය මත ය.
3). $AB$ ට $4\,cm$ ඉහළිනි.
4). $CD$ ට $4\,cm$ පහළිනි.
5). $CD$ ට $4\,cm$ ඉහළිනි.

8. එකම ස්ථානයකින් ගමන් අරඹන $A$ හා $B$ මෝටර් රථ දෙකක ප්‍රවේග කාල ප්‍රස්තාර රූපයේ පරිදි වේ. එම රථ දෙක යලි හමුවීමට ගතවන කාලය හා එවිට $A$ රථයේ ප්‍රවේගය වන්නේ,




1). $5\,s,\ 10\,m\,s^{-1}$ 2). $10\,s,\ 20\,m\,s^{-1}$
3). $20\,s,\ 40\,m\,s^{-1}$ 4). $5\,s,\ 20\,m\,s^{-1}$
5). $10\,s,\ 40\,m\,s^{-1}$

9. අංශුවක චලිතය සඳහා ප්‍රවේග $(V)$ කාල $(t)$ ප්‍රස්තාරය පහත පරිදි වේ. එයට අදාල විස්ථාපන $(s)$ කාල $(t)$ ප්‍රස්තාරය වන්නේ,







1). 2). 3). 4). 5).

10. රේඛීය ප්‍රසාරණතාවය $4 \times 10^{-5}\,K^{-1}$ වූ ද්‍රව්‍යයකින් සාදා ඇති $n$ පොට සංඛ්‍යාවක් ඇති ලෝහ කම්බි දඟරයක අරය නියතව තබා ගනිමින් උෂ්ණත්වය $1^{0}C$ කින් වැඩි කළ විට පොට සංඛ්‍යාව $n+1$ දක්වා වැඩි විය. $n$ හි අගය වන්නේ,




1). $5 \times 10^{4}$ 2). $2.5 \times 10^{4}$ 3). $1.25 \times 10^{4}$
4). $\sqrt{5} \times 10^{4}$ 5). $4 \times 10^{4}$

11. පරිපූර්ණ වායුවක් පිළිබඳ කර ඇති පහත ප්‍රකාශ සලකා බලන්න.

$A)$ නියත පරිමා ක්‍රියාවලියක් සඳහා $\Delta Q = \Delta U$ වේ.
$B)$ ස්ථිරතාපී ප්‍රසාරණයක් සඳහා $\Delta U > 0$ වේ.
$C)$ සමෝෂ්ණ ක්‍රියාවලියක් සඳහා $\Delta U$ සෑම විටම ශුන්‍ය වේ.

ඉහත ප්‍රකාශ අතුරින්,

1). $A$ පමණක් සත්‍ය වේ. 2). $A$ සහ $B$ පමණක් සත්‍ය වේ.
3). $B$ සහ $C$ පමණක් සත්‍ය වේ. 4). $A$ හා $C$ පමණක් සත්‍ය වේ.
5). $A$, $B$ සහ $C$ යන සියල්ලම සත්‍ය වේ.

12. දුර දෘෂ්ටිකත්වයෙන් පෙළෙන ඇසක අවිදුර ලක්ෂ්‍යයට ඇසේ සිට දුර $51\,cm$ කි. ඇසට $26\,cm$ දුරින් පිහිටි වස්තුවක් දක ගැනීම සඳහා පළඳින උපැස් කාචය අක්ෂි කාචයට $1\,cm$ ඉදිරියෙන් පවතී. පැලඳි උපැස් කාච වර්ගය සහ එහි බලය වන්නේ.

1). උත්තල, $+2D$ 2). අවතල $-2D$ 3). උත්තල $+50/27\,D$
4). අවතල $-50/27\,D$ 5). උත්තල $+27/13\,D$

13. ස්කන්ධය $2M$ හා $M$ වූ $A$ හා $B$ වස්තු දෙකක් රූපයේ පරිදි සුමට තලයක් මත තබා ඇත. $A$ වස්තුව මත $P$ බලයක් යෙදූ විට $B$ වස්තුව මගින් $A$ මත ඇතිකරන බලය $P/3$ ක් විය. $P$ බලය $A$ ගෙන් ඉවත් කර $B$ මත යෙදුවේ නම්, $A$ මගින් $B$ මත යෙදෙන බලය වන්නේ,




1). $P/6$ 2). $P/4$ 3). $P/3$ 4). $2P/3$ 5). $3P/2$

14. රූපයේ පරිදි නිශ්චලව පවතින වස්තුවක් මත $t = 0$ දී $F_1 = 20\,N$ හා $F_2 = 18\,N$ විශාලත්වයෙන් යුත් බල 2 ක් යොදා ඇත. $t = t_1$ වන විට $F_2$ බලය $2\,N$ කින් වැඩි කර $t = t_2$ විට එම බලය තවත් $20\,N$ කින් වැඩි කරනු ලැබේ. එවිට කාලය සමග ප්‍රවේගය වෙනස් වන අයුරු වඩාත් හොඳින් නිරූපණය කරන්නේ,






1). 2). 3). 4). 5).

15. සංතෘප්ත අවස්ථාවේ පවතින $V_0$ වාත පරිමාවක් එම උෂ්ණත්වයේ සහ පීඩනයේ ම පවතින සම්පූර්ණයෙන්ම වියලි වූ $V_1$ වාත පරිමාවක් සමග මිශ්‍ර කරනු ලබන්නේ අවසාන පරිමාව $(V_0 + V_1)$ වන ලෙස ය. මිශ්‍රණයේ සාපේක්ෂ ආර්ද්‍රතාවය වන්නේ,

1). $\left(\frac{V_0}{V_1}\right) \times 100\%$ 2). $\left(\frac{V_0+V_1}{V_0}\right) \times 100\%$ 3). $\left(\frac{V_0}{V_0 + V_1}\right) \times 100\%$

4). $\left(\frac{V_1}{V_0}\right) \times 100\%$ 5). $\left(\frac{V_1}{V_0 + V_1}\right) \times 100\%$

16. සරල අනුවර්තීය චලිතයේ යෙදෙන අංශුවක චාලක ශක්තිය $(KE)$ වේ. අංශුවේ දෝලන කේන්ද්‍රයේ දී කාලය $t$ මැනීම අරඹන විට $KE - t$ විචලනය නිවැරදිව නිරූපණය කරන ප්‍රස්තාරය වන්නේ,




1). 2). 3).




4). 5).

17. උත්තෝලකයක් ඉහළට චලිතය සිදුවන අතර ඊට අදාල ප්‍රවේග - කාල ප්‍රස්තාරය රූපයේ පරිදි වේ. එහි තැටි තරාදියක් තබා ඇති අතර කාලය සමග තැටි තරාදි පාඨාංකය වෙනස් වන ආකාරය හොඳින්ම නිරූපණය කරන්නේ.







1). 2). 3). 4). 5).

18. කෘෂ්ණ වස්තුවක උෂ්ණත්වය $1727^0C$ හි පවතින විට විමෝචනය වන විකිරණ ශක්ති තීව්‍රතාව $9 \times 10^5\ Wm^{-2}$ වේ. එම වස්තුවේ උෂ්ණත්වය $3727^0C$ දක්වා ඉහළ නැංවූ විට විමෝචනය වන විකිරණ ශක්ති තීව්‍රතාව වන්නේ,

1). $18 \times 10^5\ Wm^{-2}$ 2). $36 \times 10^5\ Wm^{-2}$ 3). $64 \times 10^5\ Wm^{-2}$
4). $72 \times 10^5\ Wm^{-2}$ 5). $144 \times 10^5\ Wm^{-2}$

19. සිහින් නළයක් තුළින් දුස්ස්‍රාවී තරලයක් ගැලීම පිළිබඳ කර ඇති පහත ප්‍රකාශ සලකා බලන්න.

A).නලයේ බිත්ති ආසන්නයේ ප්‍රවාහ සීඝ්‍රතාව උපරිම වේ.

B).ප්‍රවාහ සීඝ්‍රතාව නලයේ හරස්කඩ වර්ගඵලයට සමානුපාතික වේ.

C).ප්‍රවාහ සීඝ්‍රතාවය උෂ්ණත්වය මත රඳා පවතී.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

1). $A$ පමණි 2). $B$ පමණි
3). $C$ පමණි 4). $A$ හා $B$ පමණි
5). $B$ හා $C$ පමණි

20. රූපයේ පෙන්වා ඇති ආකාරයට පිළිවෙලින් දිග $l$ හා $2l$ වන අරය $a$ හා $a/2$ වන නල දෙකක් මගින් නියත සීඝ්‍රතාවයකින් ජලය ගලා යයි. නල දෙක භාජනයේ ඉහළ සිට $h_1$ හා $h_2$ වූ උසින් පිහිටා ඇත. $h_1/h_2$ හි අගය සමාන වන්නේ,




1). $1/2$ 2). $1/4$
3). $1/8$ 4). $1/16$
5). $1/64$

21. පාදයක දිග $a$ වූ $ABC$ සමපාද ත්‍රිකෝණයක ශීර්ෂ මත පිළිවෙලින් $+3q$ , $+2q$ සහ $-q$ ලක්ෂ්‍යයීය ආරෝපණ තුනක් අචලව තබා ඇත. මෙහි $O$ කේන්ද්‍රයේ ස්කන්ධය $m$ වූ ලක්ෂ්‍යයීය $+q$ ආරෝපණයක් තැබූ විට එය චලිතය අරඹන වේගය දෙනු ලබන්නේ,




1). $\frac{q^2}{4\pi\varepsilon_0 ma}$ 2). $\frac{\sqrt{3}\,q^2}{4\pi\varepsilon_0 ma}$ 3). $\frac{2\sqrt{3}\,q^2}{\pi\varepsilon_0 ma}$ 4). $\frac{2\sqrt{3}\,q^2}{\pi\varepsilon_0 ma}$ 5). $\frac{\sqrt{3}\,q^2\,m}{4\pi\varepsilon_0 a}$

22. ජව රෝදයක් මෝටරයකට සම්බන්ධ කර එමගින් ජව රෝදය කේන්ද්‍රය හරහා යන අක්ෂයක් වටා නිශ්චලතාවයේ සිට මිනිත්තුවට වට 1200 ක් දක්වා භ්‍රමණය කරනු ලැබේ. එවිට රෝදය මගින් කරන කාර්යය ප්‍රමාණය $\tau\ \ 8000\,\pi^2$ නම්, ජව රෝදයේ අවසාන ඝූර්ණය වන්නේ,

1). $9\ kg\,m^2$ 2). $10\ kg\,m^2$ 3). $8\ kg\,m^2$ 4). $12\ kg\,m^2$ 5). $5kg\,m^2$

23. රූපයේ පෙනෙන පරිදි හොඳින් අසුරා ඇති $AB$ ලෝහ දණ්ඩක මධ්‍යයෙහි පවතින සිලින්ඩරාකාර කුහරයක් තාප කුසන්නායක ද්‍රව්‍යයකින් පුරවා ඇත. ලෝහ දණ්ඩෙහි $A$ හා $B$ කෙළවරවල් පිළිවෙලින් $100^0C$ හා $0^0C$ හි පවත්වා ඇත්නම්, අනවරත අවස්ථාවේ දී තිත් ඉරිවලින් දැක්වෙන $PQ$ රේඛාව දිගේ උෂ්ණත්වය විචලනය වඩාත් හොඳින් නිරූපණය වන්නේ,







1). 2). 3). 4). 5).

24. $0^0C$ හි පවතින අයිස් $m_1$ ස්කන්ධයක්, කාමර උෂ්ණත්වය වන $30^0C$ හි පවතින $m_2$ ජල ස්කන්ධයකට එකතුකර අයිස් සම්පූර්ණයෙන්ම දිය වන තුරු මිශ්‍රණය මන්ථ කරනු ලැබේ. මිශ්‍රණයේ අවම උෂ්ණත්වය $10^0C$ ලෙස ලැබුණේ නම්, භාජනයෙන් සහ අවට පරිසරයෙන් මිශ්‍රණය අවශෝෂණය කරගන්නා ලද තාප ප්‍රමාණය වනුයේ (ජලයේ විශිෂ්ට තාප ධාරිතාව $= S_w$ ද අයිස් හි විලයනයේ ගුප්ත තාපය $= L$)

1). $\dfrac{m_1\,(L + 10\,S_w)}{20\,m_2\,S_w}$

2). $m_1\,(L + 10\,S_w) - 20\,m_2\,S_w$

3). $10\,m_2 S_w + m_1(L + 10\,S_w)$

4). $m_1\,(L + 10\,S_w) - 10 m_2\,S_w$

5). $20\,m_2\,S_w - m_1\,(L + 10\,S_w)$

25. නක්ෂත්‍ර දුරේක්ෂයක් සාමාන්‍ය සිරුමාරුවේ ඇති විට එහි කෝණික විශාලනය $20$ වන අතර උපකරණයේ දිග $105\,cm$ වේ. අවනෙතේ නාභීය දුර සහ අක්ෂි වලයට උපනෙතේ සිට දුර වන්නේ,

1). $5\,cm,\ 5.25\,cm$ 2). $5\,cm,\ 51.22\,cm$ 3). $100\,cm,\ 51.22\,cm$

4). $100\,cm,\ 4.77\,cm$ 5). $100\,cm,\ 5.25\,cm$

26. ඒකාකාර කඹයක දිග $3\,m$ සහ ස්කන්ධය $12\,kg$ වේ. එහි කෙළවරක් ඉහළින් වූ අචල තිරස් ආධාරකයකට ගැටගසා අනෙක් කෙළවරට ස්කන්ධය $2\,kg$ වූ කුඩා වස්තුවක් ඈඳා ඇත. තරංග ආයාමය $80\,mm$ වූ තීර්යක් ස්කන්ධයක් කඹයේ පහළ කෙළවර ඇති කළවිට එය කඹයේ මධ්‍ය ලක්ෂ්‍යයට ළඟා වන මොහොතේ තරංග ආයාමය වන්නේ,

1). $8\,cm$ 2). $16\,cm$ 3). $8\sqrt{6}\,cm$ 4). $8\sqrt{7}\,cm$ 5). $16\sqrt{3}\,cm$

27. රූපයේ දක්වා ඇති ජාලයෙහි $A$ සහ $B$ ලක්ෂ්‍ය අතර සපල ප්‍රතිරෝධය වන්නේ,




1). 1 Ω 2). 2 Ω 3). 3 Ω
4). 9 Ω 5). 14 Ω

28. රූපයේ දැක්වෙන පරිදි පරිපථය සකසා $A$ හා $B$ අතරට නියත විභව අන්තරයක් ලබා දුන් විට $A_1$ පරිපූර්ණ ඇමීටරයේ පාඨාංකය $0.8\,A$ ක් විය. $A_2$ පරිපූර්ණ ඇමීටරයේ පාඨාංකය විය හැක්කේ,




1). $0.1\,A$ 2). $0.2\,A$ 3). $0.3\,A$
4). $0.4\,A$ 5). $0.5\,A$

29. ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කරන සර්ව සම තරංග දෙකක් ප්‍රතිවිරුද්ධ කලාවෙන් අධිස්ථාපනයට ලක්වූ විට තරංගයේ,

1). තීව්‍රතාවය 4 ගුණයකින් වැඩිවේ. 2). තීව්‍රතාවය 2 ගුණයකින් වැඩිවේ.
3). තීව්‍රතාවය ශුන්‍ය වේ. 4). සංඛ්‍යාතය දෙගුණ වේ.
5). සංඛ්‍යාතය වෙනසක් නොවේ.

30. උෂ්ණත්වය $30^0C$ හි පවතින කාමරයක එල්ලා ඇති උණුසුම් වස්තුවක උෂ්ණත්වය $70^0C$ සිට $60^0C$ දක්වා සිසිල් වීමට මිනිත්තු 5 ක් ගතවේ. එම තත්වය යටතේම උෂ්ණත්වය $54^0C$ සිට $46^0C$ දක්වා තවදුරටත් සිසිල් වීමට ගතවන කාලය මිනිත්තු වලින් කොපමණ ද?

1). 7 2). 10.5 3). 14 4). 17.5 5). 21

31. $A\,(12\,V,\ 24\,W)$ හා $B\,(9\,V\,,\ 27\,W)$ ලෙස ප්‍රමාණනයකර ඇති විදුලි බල්බ දෙකක් විද්‍යුත් ගාමක බලය $12\,V$ හා අභ්‍යන්තර ප්‍රතිරෝධය ශුන්‍ය වූ කෝෂයකට සම්බන්ධ කර ඇත. පහත ප්‍රකාශ සලකා බලන්න.




A - $X$ හා $Y$ බල්බ දෙක එහි නියමිත ක්ෂමතා වලින් යුක්තව දල්වේ.
B - $Y$ නියමිත දීප්තියෙන් යුතුව දැල්වෙන නමුත් $X$ හි දීප්තිය අඩු වී ඇත.
C - $X$ දැවී ගියහොත් $Y$ ද දැවී යයි.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශ / ප්‍රකාශ වන්නේ,

1). $A$ පමණි 2). $B$ පමණි 3). $A$ හා $C$ පමණි
4). $B$ හා $C$ පමණි 5). $A,\ B$ හා $C$ සියල්ලම

32. මූලික අංශු පිළිබඳව දක්වා ඇති පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි නොවන්නේ,

1). ක්වාර්ක් නැමති මූලික අංශු වර්ගයෙන් ප්‍රෝටෝන සහ නියුට්‍රෝන සෑදී ඇත.

2). ඉලෙක්ට්‍රෝනය, ලෙප්ටන් නැමති කාණ්ඩයේ මූලික අංශුවක් වේ.

3). හැඩ්‍රෝන කාණ්ඩය ක්වාක් අංශු 6 කින් සමන්විත වේ.

4). $Up$ ක්වාක් අංශුව $(u)$ ඍණ ආරෝපිත වන අතර $down$ ක්වාක් අංශුව $(d)$ ධන ආරෝපිත වේ.

5). පොසිට්‍රෝන, ඉලෙක්ට්‍රෝන සහ නියුට්‍රිනෝ මූලික අංශු වේ.

33. විද්‍යුත් ක්ෂේත්‍රයක සමවිභව පෘෂ්ඨ පිළිබඳව පහත දක්වා ඇති කුමක් සත්‍ය වේ ද?

1). ඕනෑම හැඩයකින් යුත් සමවිභව පෘෂ්ඨයක් මත සෑම ලක්ෂ්‍යයකම විද්‍යුත් ක්ෂේත්‍ර තීව්‍රතාවයේ විශාලත්වය සමාන වේ.

2). සමවිභව පෘෂ්ඨයක් මත ඇති ලක්ෂ්‍යයක විද්‍යුත් ක්ෂේත්‍ර තීව්‍රතාවය ශූන්‍ය විය නොහැක.

3). සෑම සමවිභව පෘෂ්ඨයක්ම ගෝලාකාර හැඩයක් ගනී.

4). විද්‍යුත් බල රේඛා සෑම විටම සමවිභව පෘෂ්ඨවලට ලම්බක වේ.

5). සමවිභව පෘෂ්ඨයක් මත පිහිටි ලක්ෂ්‍ය දෙකක් අතර ආරෝපණයක් ගෙන යෑමට කළයුතු කාර්යය ගෙන යන මාර්ගය මත රඳා පවතී.

34. දී ඇති පරිපථයේ $X$ හා $Y$ අතර විභව අන්තරය වන්නේ,




1). $6\,V$ 2). $5\,V$ 3). $4\,V$

4). $3\,V$ 5). $1\,V$

35. පෙන්වා ඇති පරිපථයේ කෝෂවල අභ්‍යන්තර ප්‍රතිරෝධ නොගිනිය හැකි තරම් කුඩා වේ. පරිපථයේ $Y$ ට සාපේක්ෂව $X$ හි විභවය,




1). $-0.5\,V$

2). $-1.5\,V$

3). $+0.5\,V$

4). $+1.5\,V$

5). $+3.5\,V$

36. රූපයේ පරිදි සමතුලිතව පවතින දණ්ඩේ ගුරුත්ව කේන්ද්‍රය පිහිටීමට වඩාත්ම සුදුසු ලක්ෂ්‍යය වන්නේ,




1). $A$

2). $B$

3). $C$

4). $D$

5). $E$

37. ස්කන්ධය $100\ g$ වන $AB$ ඒකාකාර දණ්ඩක් එහි මධ්‍ය ලක්ෂ්‍යයෙන් දුනු තරාදියක් මගින් එල්ලා ඇත. දණ්ඩේ $A$ කෙළවරින් $20\ g$ ද, $B$ කෙළවරින් $40\ g$ ද තබා ඇත. තවද $B$ හි තබන ලද පිහි දාරයක් ආධාරයෙන් දණ්ඩ තිරස්ව සමතුලිතව තබා ඇත. දුනු තරාදි පාඨාංකය කුමක් ද?

1). $0$ 2). $70 \times 10^{-3}\ g$ 3). $100 \times 10^{-3}\ g$
4). $140 \times 10^{-3}\ g$ 5). $160 \times 10^{-3}\ g$

38. රූපයේ දැක්වෙන පරිපථයේ $V_1 = 3V$, $V_2 = 2V$ හා $V_3 = V$ ප්‍රදාන සපයා ඇත. $R_1 = R_2 = R_3 = R$ විට ප්‍රතිදානය $V_O$ හි අගය වන්නේ,




1). $0$ 2). $-3\ V$
3). $+3\ V$ 4). $-6\ V$
5). $+6\ V$

39. නිශ්චල තිරස් තහඩුවක් මත දුස්ස්‍රාවිතා සංගුණකය $\eta$ වූ ද්‍රවයක් ආස්තරීය ප්‍රවාහයක් ලෙස පවත්වා ගැනේ. ඉහළ ද්‍රව ස්ථරය $V$ ඒකාකාර ප්‍රවේගයෙන් චලනය වන අතර නිසල පහල ස්ථරය $d$ ගැඹුරකින් ඇත. ඉහළ ද්‍රව ස්ථරය මගින් තහඩුවේ $A$ ක්ෂේත්‍රඵලයක් මත යෙදෙන දුස්ස්‍රාවී බලය නිවැරදිව දක්වා ඇත්තේ,

1). $\frac{\eta A V}{d}$ ප්‍රවාහයේ දිශාවට 2). $\frac{\eta A V}{d}$ ප්‍රවාහයට විරුද්ධ දිශාවට 3). ශූන්‍ය වේ.
4). $\frac{\eta V}{A d}$ ප්‍රවාහයේ දිශාවට 5). $\frac{\eta V}{A d}$ ප්‍රවාහයට විරුද්ධ දිශාවට

40. පහත දැක්වෙන ධාරිත්‍රක පද්ධතිවල සඵල ධාරිතාව නිවැරදිව දක්වා ඇත්තේ කුමන ප්‍රකාශයේ ද?

a).



b).



c).



1). $a < b < c$ 2). $a > b > c$ 3). $a > b = c$ 4). $a = b = c$ 5). $a < b = c$

41. ස්කන්ධය $m$ හා ආරෝපණය $-q$ වන කුඩා සන්නායක ගෝලයක් රූපයේ දැක්වෙන $E$ වන විද්‍යුත් ක්ෂේත්‍රයක් හා ගුරුත්වාකර්ෂණ ක්ෂේත්‍රයක් පවතින ප්‍රදේශයක $l$ දිගැති පරිවාරක නූලකින් එල්ලා සරල අවලම්භයක ආකාරයට දෝලනය වීමට සලස්වනු ලැබේ. මෙම අවලම්භයේ දෝලන කාලාවර්තය $T$ නම්, එය දෙනු ලබන නිවැරදි ප්‍රකාශය වන්නේ,



1). $T = 2\pi\sqrt{\frac{l}{g}}$ 2). $T = 2\pi\sqrt{\frac{l}{g - E}}$ 3). $T = 2\pi\sqrt{\frac{l}{g - Eq/m}}$

4). $T = 2\pi\sqrt{\frac{l}{g + E}}$ 5). $T = 2\pi\sqrt{\frac{l}{g + Eq/m}}$

42. කෝෂයක විද්‍යුත්ගාමක බලය $(E_1)$ නිර්ණය කිරීම සඳහා භාවිත කරන විභව මාන සැකැස්මක් රූපයේ පෙන්වා ඇත. ලැබුණු සංතුලන දිග $l$ හි අගය වැඩි කර ගැනීම සඳහා,




1). $X$ කෝෂය සමග ප්‍රතිරෝධයක් ශ්‍රේණිගතව සම්බන්ධ කළ යුතුය.
2). $X$ කෝෂය සමග ප්‍රතිරෝධයක් සමාන්තරගතව සම්බන්ධ කළ යුතුය.
3). $AB$ සමග ප්‍රතිරෝධයක් ශ්‍රේණිගතව සම්බන්ධ කළ යුතුය.
4). $E_0$ හි අගය වැඩි කළ යුතුය.
5). $AB$ සඳහා අඩු විෂ්කම්භයකින් යුතු කම්බියක් යොදාගත යුතුය.

43. රූපයේ දක්වා ඇත්තේ අනාකුල ප්‍රවාහයක යෙදෙන අසම්පීඩ්‍ය තරලයක් $A$ සිට $B$ දක්වා ගලායන ආකාරයයි. $A$ ට සාපේක්ෂව $B$ හි දී,




| | පීඩන ශක්තිය | විභව ශක්තිය | චාලක ශක්තිය |
|---|---|---|---|
| 1) | අඩු වේ | වැඩි වේ | අඩු වේ. |
| 2) | වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |
| 3) | වෙනස් නොවේ | අඩු වේ | වැඩි වේ |
| 4) | අඩු වේ | වැඩි වේ | වැඩි වේ. |
| 5) | අඩු වේ | අඩු වේ | වැඩි වේ. |

44. වාතය තුල තබා ඇති ඒකාකාර ලෙස ආරෝපණය කර ඇති තුනී ලෝහ තහඩුවක් $+4\,V$ විභවයක පවත්වාගෙන ඇත. එම තහඩුවට $1\,cm$ ඉහළින් වූ සමවිභව පෘෂ්ඨික විභවය $+3\,V$ වේ නම්, තහඩුවට $2\,cm$ පහළින් පවතින සමවිභව පෘෂ්ඨයක විභවය විය හැක්කේ,

1). $+6\,V$ 2). $+2\,V$ 3). $-2\,V$
4). $-3\,V$ 5). $+3\,V$

45. $E$ නම් පෘථිවිය $S$ නම් සූර්යයා වටා ඉලිප්සාකාර පථයක රූපයේ ආකාරයට ගමන් කරයි. $A$ හි දී පෘථිවිය ගමන් කරන කෝණික වේගය $\omega$ නම් $B$ හි දී පෘථිවිය ගමන් කරන කෝණික වේගය වනුයේ

1). $\omega/16$ 2). $\omega/8$ 3). $\omega/4$
4). $\omega$ 5). $4\omega$



46. $A$ සහ $B$ යනු සුමට තිරස් තලයක අචලව තබා ඇති ලක්ෂ්‍යාකාර සමාන ස්කන්ධ දෙකක් වන අතර $C$ නම් සමාන ලක්ෂ්‍යාකාර ස්කන්ධයක් රූපයේ ආකාරයට $A$ හා $B$ ස්කන්ධ දෙක අතරින් එම තලය මත $A$ හා $B$ ට සම දුරින් වූ රේඛීය පථයක ගමන් කරයි. $A$ හා $B$ මගින් $C$ ස්කන්ධය මත ක්‍රියා කරන සඵල ගුරුත්වාකර්ෂණ බලයේ විශාලත්වය, $x-$ අක්ෂය දිගේ දුර සමග වෙනස් වන ආකාරය වඩාත්ම හොඳින් නිරූපණය වන ප්‍රස්තාරය තෝරන්න.







1). 2). 3). 4). 5)

47. පහත දී ඇති තාර්කික පරිපථයේ ප්‍රදාන $P$ හා $Q$ වන අතර ප්‍රතිදානය $F$ වේ. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.




A). $AND$ ද්වාරයේ ප්‍රතිදානය $0$ වූ සෑම විටම $F = 1$ වේ.
B). $A = 1$ සහ $B = 1$ වූ විට $F = 1$ වේ.
C). $A = 0$ හා $B = 0$ වූ විට $F = 1$ වේ.

මින් සත්‍ය වන්නේ,

1). $A$ පමණි 2). $B$ පමණි
3). $C$ පමණි 4). $A$ හා $B$ පමණි
5). $B$ හා $C$ පමණි

48. $S$ යනු $+q$ ආරෝපණයක් වටා පවතින විද්‍යුත් ක්ෂේත්‍රයක ඇති ගවුස් පෘෂ්ඨයකි. $S$ පෘෂ්ඨය හරහා සඵල විද්‍යුත් ස්‍රාවය $\emptyset$ සඳහා කර ඇති පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.




A). $S$ පෘෂ්ඨයේ හැඩය ගෝලාකාර වූ විට $\emptyset$ අගය අඩු වේ.
B). $+q$ ආරෝපණය $S$ පෘෂ්ඨය මත තැබූ විට $\emptyset$ හි අගය වෙනස් වේ.
C). $+q$ තබා ඇති පාරවිද්‍යුත් මාධ්‍යය වෙනස් කළ විට $\emptyset$ හි අගය වෙනස් වේ.

ඉහත සඳහන් ප්‍රකාශ වලින්,

1). $A$ පමණක් සත්‍ය වේ. 2). $B$ පමණක් සත්‍ය වේ.
3). $C$ පමණක් සත්‍ය වේ. 4). $A$ සහ $B$ පමණක් සත්‍ය වේ.
5). $B$ සහ $C$ පමණක් සත්‍ය වේ.

49. අභ්‍යන්තර අරය $2R$ ද බාහිර අරය $3R$ ද වූ අනාරෝපිත කුහර සන්නායක කබොලක් තුළ ඒක කේන්ද්‍රයීය වන සේ අරය $R$ වූ සන්නායක ගෝලයක් තබා එයට $+Q$ ආරෝපණයක් ලබාදෙනු ලැබේ. එහි $OX$ දිගේ විද්‍යුත් විභවය $(V)$ දුර $(x)$ සමග වෙනස් වන ආකාරය නිවැරදිව පෙන්වන ප්‍රස්තාරය වනුයේ,







1). 2). 3). 4). 5).

50. ප්‍රකාශ කෝෂයක $C$ කැතෝඩ ලෝහ පෘෂ්ඨය මත එකම විකිරණ ශක්ති තීව්‍රතාවයක් $(Wm^{-2})$ සහිත රතු (තරංග ආයාමය $\lambda_R$) සහ කොළ (තරංග ආයාමය $\lambda_G$) ( $\lambda_R > \lambda_G$ වේ.) ඒක වර්ණ ආලෝක කදම්බ දෙකක් වෙන වෙනම පතනය වීමට සලස්වනු ලැබේ. එම ආලෝක කදම්බ වල සංඛ්‍යාතයන් $C$ සාදා ඇති ද්‍රව්‍යයේ දේහලීය සංඛ්‍යාතයට වඩා වැඩිය. පතිත පෝටෝන වලින් එකම ප්‍රතිශතයකින් ප්‍රකාශ ඉලෙක්ට්‍රෝන විමෝචනය වේ නම් රතු සහ කොළ වර්ණ දෙක සඳහා $(V)$ සහ $(A)$ හි පාඨාංක වන $V$ සහ $I$ හි විචලනය එකම ප්‍රස්තාරයක නිවැරදිව නිරූපණය වන ප්‍රස්තාරය වන්නේ,






සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Southern Provincial Department of Education

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, තෙවන වාර පරීක්ෂණය, 2022 ජනවාරි
## General Certificate of Education (Adv. Level), Grade 13, Third Term Test, January 2022

භෞතික විද්‍යාව II
Physics II

01 S II

පැය තුනයි
Three hours

නම: ............................................................ ශ්‍රේණිය : ............................................

වැදගත් :

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු 16 කින් යුක්ත වේ.
* මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යන කොටස් දෙකින් යුක්ත වේ. කොටස් දෙකට ම නියමිත කාලය පැය තුනයි.

**A කොටස - ව්‍යුහගත රචනා (පිටු 2 - 7)**

* සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න. ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

**B කොටස - රචනා (පිටු 8 - 16)**

* මෙම කොටස ප්‍රශ්න හයකින් සමන්විත වන අතර ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
* සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A හා B කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ A කොටස B කොටසට උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට බාර දෙන්න.
* ප්‍රශ්න පත්‍රයේ B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| දෙවැනි පත්‍රය සඳහා | | |
|---|---|---|
| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
| A | 01 | |
| | 02 | |
| | 03 | |
| | 04 | |
| B | 05 | |
| | 06 | |
| | 07 | |
| | 08 | |
| | 09 (A) | |
| | 09 (B) | |
| | 10 (A) | |
| | 10 (B) | |
| එකතුව | | |

අවසාන ලකුණ

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

අත්සන

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| අධීක්ෂණය කළේ : | |

මෙම තීරුවේ කිසිවක් නොලියන්න.

## A කොටස - ව්‍යුහගත රචනා

01. ද්‍රවයක ඝනත්වය ප්‍රස්තාරික ක්‍රමයෙන් සෙවීම සඳහා කරනු ලබන පරීක්ෂණයක දී ඔබට පහත දෑ සපයා ඇත.

1). මීටර් $1/2$ කෝදු 2 ක් සහ $U$ නලයක්.

2). ජලය අඩංගු බීකරයක්

3). ජලයට වඩා ඝනත්වය අඩු ද්‍රවයක් සහිත බීකරයක්

4). පුනීල

5). ආධාරක



i). දෙන ලද රූපයේ පහත ඒවා ලකුණු කරන්න.

1). පොදු අතුරු මුහුණත

2). ජල මට්ටම

3). ද්‍රව මට්ටම

ii). ඉහත දී ඇති රූපයේ ඔබ ලබාගත යුතු මිනුම් දෙක $h_1$ හා $h_2$ ලෙස ලකුණු කරන්න. (මෙහි ද්‍රව කඳ $h_1$ ලෙසත් සෙන්ටිමීටර්වලින් මැන ඇති බවත් සලකන්න.)

iii). ද්‍රවයේ සහ ජලයේ ඝනත්ව පිළිවෙලින් $d_1$ හා $d_2$ ලෙස ගෙන $d_1$ සඳහා ප්‍රකාශනයක් $d_2$, $h_1$ හා $h_2$ ඇසුරින් ලබා ගන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

iv). a). $d_1$ නිර්ණය කිරීමට ප්‍රස්තාරයක් ඇඳීම සඳහා ඉහත ප්‍රකාශනය නැවත සකසන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

b). ස්වායත්ත විචල්‍ය හා පරායත්ත විචල්‍ය නම් කරන්න.

ස්වායත්ත විචල්‍යය - ..........................................................................................

පරායත්ත විචල්‍යය - ..........................................................................................

v). ලබාගත් මිනුම් වලින් අඳින ලද ප්‍රස්තාරයක් පහත දැක්වේ.

a). එම ප්‍රස්තාරයේ අක්ෂ නම් කරන්න.



මෙම තීරුවේ කිසිවක් නොලියන්න.

b). අනුක්‍රමණය සෙවීමට භාවිතා කළ ලක්ෂ්‍ය $P$ හා $Q$ ලෙස ලකුණු කර ප්‍රස්තාරයේ අනුක්‍රමණය සොයන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

c). එමගින් ද්‍රවයේ ඝනත්වය සොයන්න. (ජලයේ ඝනත්වය $1000\ kg\ m\ s^{-1}$ ලෙස සලකන්න.)

.......................................................................................................................

vi). මෙම පරීක්ෂණයේ දී ඝනත්වය සෙවීමට යොදාගත් ද්‍රවයට තිබිය යුතු අනිවාර්ය ගුණාංග 2 ක් ලියන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

vii). පරීක්ෂණය සිදු කිරීමේ දී $U$ නලයට පළමුව දැමිය යුත්තේ ද්‍රවය ද? ජලය ද? ඔබගේ පිලිතුරට හේතු දක්වන්න.

.......................................................................................................................

viii). මෙම පරීක්ෂණය සිදු කිරීමේ දී ශිෂ්‍යයෙකු විසින් අනුරූප බාහුවට ජලය එකතු කරමින් මිනුම් ලබා ගැනීමට උත්සාහ කරයි. එම ක්‍රියාව හා ඔබ එකඟ වන්නේ ද? පිළිතුර පැහැදිලි කරන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

02. මිශ්‍රණ ක්‍රමය භාවිතා කර ලෝහයක විශිෂ්ඨ තාප ධාරිතාව නිර්ණය කිරීමට ශිෂ්‍යයෙකුට නියමිතව ඇත. පාසල් පරීක්ෂණාගාරයේ දී ජලය, මන්තය සමග තාප පරිවරණය කරන ලද කැලරි මීටරයක්, $0^0C - 110^0C$ හා $0^0C - 50^0C$ ලෙස ක්‍රමාංකණය කර ඇති උෂ්ණත්වමාන 2 ක්, $100^0C$ රත් කරන ලද කුඩා ලෝහ බෝල ඔහුට සපයා ඇත.

i). මෙම පරීක්ෂණය සඳහා අවශ්‍ය අනෙකුත් උපකරණ මොනවා ද?

.......................................................................................................................

මෙම තීරුවේ කිසිවක් නොලියන්න.

ii). පරීක්ෂණය සිදු කිරීම සඳහා යොදාගත යුතු උෂ්ණත්වමානය කුමක් ද? එම උෂ්ණත්වමානය භාවිතා කිරීමට හේතුව ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

iii). මෙම පරීක්ෂණයේ දී ඔබ ලබාගන්නා මිනුම් පරීක්ෂණය සිදුකරන අනුපිළිවෙලට සඳහන් කරන්න.

1). ..........................................................................................................................

2). ..........................................................................................................................

3). ..........................................................................................................................

4). ..........................................................................................................................

5). ..........................................................................................................................

iv). මේ සඳහා කැලරිමීටරයට ජලය එකතු කරන ලද අවස්ථා 3 ක් පහත දැක්වේ.



A අවස්ථාව B අවස්ථාව C අවස්ථාව

a). පරීක්ෂණය සඳහා ඔබ තෝරා ගන්නේ කුමන අවස්ථාව ද?

..........................................................................................................................

b). ඔබ අනෙක් අවස්ථා තෝරා නොගැනීමට හේතු දෙකක් බැගින් ලියන්න.

........... අවස්ථාව හේතු 1). ..............................................................................

2). ..............................................................................

........... අවස්ථාව හේතු 1). ..............................................................................

2). ..............................................................................

v). මෙම පරීක්ෂණයේ දී ප්‍රතිඵල මගින් ලැබූ අගයක් පහත පරිදි වේ. ජලයේ විශිෂ්ඨ තාප ධාරිතාව සොයන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

මෙම තීරුවේ කිසිවක් නොලියන්න.

vi). a). මේ සඳහා තාප පරිහරණය කරන ලද කැලරි මීටරයක් භාවිතයේ ඇති වාසිය කුමක් ද?

..............................................................................................................................

..............................................................................................................................

b). මෙම පරීක්ෂණයේ දී තාප හානිපූර්ණ ක්‍රමය යොදාගත්තේ නම්, අනුගමනය කරන පරීක්ෂණාත්මක ක්‍රියා පිළිවෙල කුමක් ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

vii). ලෝහ බෝල කැලරිමීටරයට එක් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

03. පාසල් විද්‍යාගාරය තුල දී අවතල කාචයක නාභිය දුර සෙවීමේ පරීක්ෂණයක අසම්පූර්ණ ඇටවුමක් පහත රූපයේ දක්වා ඇත. ඊට අමතරව අන්වේශන කුරක්, නිවේශන කුරක් සහ කඩතිරයක් ඔබට සපයා ඇත.




(i) සපයා ඇති වස්තු කුර (අන්වේශන කුර) සහ කඩතිරය තැබිය යුතු නිවැරදි පිහිටුම් රූපයේ ඇඳ ඒවා P හා S ලෙස අනුපිළිවෙලින් ලකුණු කරන්න.

(ii) S කඩතිරයක් යොදා ගැනීමට හේතුව සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

(iii) ප්‍රතිබිම්භයේ පිහිටීම සොයා ගැනීම සඳහා නිවේෂන කුර තැබිය යුතු ආකාරය රූපයේ ඇඳ Q ලෙස නම් කරන්න.

(iv) P හි ප්‍රතිබිම්භයේ පිහිටීම සොයා ගැනීම සඳහා අනුගමනය කරන පරීක්ෂණාත්මක ක්‍රමවේදය සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

(v) රූපයේ දැක්වෙනුයේ P හි අතාත්වික ප්‍රතිබිම්බය නිරීක්ෂණය සඳහා ශිෂ්‍යයා කාචයේ ප්‍රකාශ අක්ෂය මත පිහිටි $E$ ලක්ෂ්‍යයේ ඇස තැබූ විට ඔහුට පෙනෙන දෘෂ්‍ය පථයයි. නිවේෂණ කුරේ තල දර්පණය තුළින් පෙනෙන ප්‍රතිබිම්බය හා වස්තුවේ ප්‍රතිබිම්බය සමපාත අවස්ථාවේ දී පෙනෙන ආකාරය එහි ඇඳ දක්වන්න.



මෙම තීරුවේ කිසිවක් නොලියන්න.

(vi) (a) වස්තු දුර U , ප්‍රතිබිම්බ දුර V , නාභීය දුර F ලෙස ගෙන ඉහත පරීක්ෂණය සඳහා කාච සූත්‍රයට කාටිසියානු ලකුණු සම්මුතිය යොදා ලියන්න.

.................................................................................................................................

.................................................................................................................................

(b) ප්‍රස්තාරික ක්‍රමයකින් නාභීය දුර සෙවීම සඳහා ඉහත (vi) හි ප්‍රකාශනය සකසන්න.

.................................................................................................................................

.................................................................................................................................

(c) එහි ස්වායක්ත විචල්‍යය හා පරායක්ත විචල්‍යය කුමක් ද?

ස්වායක්ත විචල්‍යය ..........................................................................................

පරායක්ත විචල්‍ය ..........................................................................................

(d) ඔබ බලාපොරොත්තු වන ප්‍රස්තාරයේ දළ සටහනක් ඇඳ දක්වන්න.



(e) ප්‍රස්තාරයේ අන්තඛණ්ඩය $0.05\ \text{cm}^{-1}$ වූ යේ නම් කාචයේ නාභීය දුර සොයන්න.

.................................................................................................................................

.................................................................................................................................

04. පහත දී ඇත්තේ සේතු පරිපථයකි. එහි $R_1$, $R_3$ , $R_4$ යනු නියත ප්‍රතිරෝධ වන අතර $R_2$ යනු විචල්‍ය ප්‍රතිරෝධයකි.




a). ඉහත පරිපථයේ (X) ලෙස සඳහන් කරන්නේ කුමක් ද?

..............................................................................

b). $R_2$ හි අගය ශූන්‍යයේ සිට ඉතා ඉහළ අගයකට වෙනස් වන විට (X) හි ඔබ බලාපොරොත්තු වන නිරීක්ෂණය කුමක් ද?

.................................................................................................................................

.................................................................................................................................

c). $R_2$ හි කිසියම් අගයකට සේතුව සමතුලනය වූ විට X උපාංගය හරහා ප්‍රතිරෝධය කුමක් ද?

.................................................................................................................................

d). එය සංතුලන අවස්ථාවේ දී $R_1$, $R_2$, $R_3$, $R_4$ අතර සම්බන්ධතාවයක් ගොඩ නගන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

මෙම තීරුවේ කිසිවක් නොලියන්න.

e). ලෝහ කම්බියක ප්‍රතිරෝධයේ උෂ්ණත්ව සංගුණකය උෂ්ණත්වය සමග විචලනය වන ආකාරය අන්වේෂණය කර ප්‍රතිරෝධයේ උෂ්ණත්ව සංගුණකය සෙවීමට ඔබට නියමව ඇත. ලී දණ්ඩක එතීමෙන් දඟරය සාදා ඇත්තේ එකිනෙක ස්පර්ශ නොවන පරිදි වේ. මෙය ඉහත $R_2$ විචල්‍ය ප්‍රතිරෝධය ඉවත්කර එහි $X$ හා $Y$ අග්‍ර එම ස්ථානයට සම්බන්ධ කරනු ලැබේ.




i). මෙම පරීක්ෂණයේ දී ජලය වෙනුවට පොල්තෙල් භාවිතා කිරීමට තීරණය කර ඇත. මෙම තීරණය සඳහා විද්‍යාත්මක හේතු දෙකක් දෙන්න.

1. ........................................................................................................................
2. ........................................................................................................................

ii). $0^0C$ අනුරූප ප්‍රතිරෝධ $R_0$ ද, $\theta^0C$ ට අනුරූප ප්‍රතිරෝධ $R_\theta$ ද නම්, ප්‍රතිරෝධයේ උෂ්ණත්ව සංගුණකය $\alpha$ සඳහා ප්‍රකාශනයක් ලියන්න.

........................................................................................................................

iii). උෂ්ණත්වය සමග ඔබ බලාපොරොත්තු වන විචලනය පහත ප්‍රස්තාරයේ අඳින්න.




iv). ඉහත ප්‍රස්තාරයෙන් උකහා ගත හැකි රාශීන් මගින් ප්‍රතිරෝධයේ උෂ්ණත්ව සංගුණකය සඳහා ප්‍රකාශනයක් ලියන්න.

........................................................................................................................
........................................................................................................................

v). සේතුව සංතුලනය වූ අවස්ථාවක පරිපථය පහත ආකාරයෙන් වෙනස් කර එය සිදුකළ හැකි බව සිසුන් ප්‍රකාශ කරයි. එම ප්‍රකාශනය සත්‍ය/අසත්‍ය ද යන්න පැහැදිලි කරන්න.



## B කොටස - රචනා

05. a). වස්තුවක් දුනු තරාදියකින් එල්ලා එය ජලයේ ගිල්වූ විට පාඨාංකයේ වෙනසක් ඇති වේ.

i). වස්තුව ජලයේ ගිල්වූ විට හා වාතයේ ඇති විට එය මත ක්‍රියාකරන බල දළ රූපයක දක්වා මෙම පාඨාංකවල වෙනසට හේතුව ලියන්න.

ii). වස්තුවට අදාළ දුනු තරාදි පාඨාංකය කිලෝග්‍රෑම් වලින්, වාතයේ ඇති විට $w_1$ ද, ජලයේ ගිල්වූ විට $w_2$ ද නම් උඩුකුරු තෙරපුම් බලය $U$ සඳහා ප්‍රකාශනයක් ලියන්න.

iii). පරිමාව $V_1$ වූ වස්තුවක් සම්පූර්ණයෙන් ජලයේ ගිලී ඇතිවිට එය මත ජලය මගින් ඇතිකරන උඩුකුරු තෙරපුම් බලය $U$ සඳහා ප්‍රකාශනයක් ආකිමිඩීස් මූලධර්මය ඇසුරෙන් ලියන්න. (ජලයේ ඝනත්වය $\rho_w$ )

iv). වස්තුවේ ඝනත්වය $\rho$ සඳහා ප්‍රකාශනයක් $w_1$ , $w_2$ හා $\rho_w$ ඇසුරෙන් ලබාගන්න.

b). රන් (Gold) හා තඹ (Copper) මිශ්‍රකිරීමෙන් කහ පැහැති රන් භාණ්ඩ තැනීමට අවශ්‍ය මිශ්‍රලෝහය සාදා ගන්නා අතර එහි රන් ප්‍රතිශතය අනුව කැරට් අගය තීරණය වේ. රන් භාණ්ඩය වාතයේ දී හා ජලයේ ගිල්වා මිශ්‍ර ලෝහයේ බර මැන ඝනත්වය හා රන් ප්‍රතිශතය සෙවීමෙන් එහි කැරට් අගය නිර්ණය කරනු ලැබේ. පහත දැක්වෙනුයේ ඊට අදාළ දත්ත වගුවකි.

| කැරට් අගය | රත්‍රන්වල ප්‍රතිශතය % | මිශ්‍ර ලෝහයේ ඝනත්වය $g/cm^3$ |
|---|---|---|
| 24 | 99.9 | 19.5 |
| 22 | 91.6 | 15.6 |
| 21 | 87.5 | 14.8 |
| 18 | 75.0 | 13.8 |
| 14 | 58.8 | 12.9 |

i). පරිමාව $21.74\ cm^3$ වූ රන් වලල්ලක ස්කන්ධය $300\ g$ ක් වූයේ නම් එහි රන් ප්‍රතිශතයත් කැරට් අගයත් වගුව ඇසුරින් ලියන්න.

ii). වාතයේ දී ස්කන්ධය $39\ g$ වූ වලල්ලක් ජලයේ ගිල්වූ විට එහි ස්කන්ධය සොයන්න. වලල්ලේ රන් වල කැරට් අගය $22$ ක් වේ. $\rho_w = 1000\ kg\ m^{-3}$

iii). රජ කෙනෙක් ඔටුන්නක් සෑදීම සඳහා බර $15.6\ N$ වු කැරට් $24$ රත්‍රන් ප්‍රමාණයක් රන්කරුවාට ලබාදුන් අතර ඔහු විසින් එම කාර්යය නියමිත දිනට නිමකර භාරදෙන ලදී. රන්කරුවා ඔටුන්න සෑදීම සඳහා රජතුමා ලබාදුන් රත්‍රන්ම භාවිතා කළේ ද යන්න දැනගැනීමට සඳහා ඔටුන්න ජලයේ ගිල්වා බර මැන්න විට එය $14.8\ N$ විය.

a) ඔටුන්න සාදා ඇති රත්‍රන්වල ඝනත්වය ගණනය කරන්න.

b) රජතුමා විසින් ලබාදුන් රත්‍රන්ම ඔටුන්න සෑදීමට යොදා ගත්තේ ද? ඔබේ පිළිතුර තහවුරු කරන්න.

iv). සාමාන්‍යයෙන් රත්‍රන් භාණ්ඩ සෑදීමෙන් පසු එවායේ ඝනත්වය යොදාගත් රත්‍රන්වල නියම ඝනත්වයට වඩා වෙනස්වන්නේ ඇයි?

06. a). i) ධ්වනි තීව්‍රතාවය $(I)$ අර්ථ දක්වන්න.

ii) ක්ෂමතාවය $p$ වූ ධ්වනි ප්‍රභවයක සිට $r$ දුරින් පිහිටි ලක්ෂ්‍යයක ධ්වනි තීව්‍රතාව $I$ සඳහා ප්‍රකාශනයක් $p$ සහ $r$ ඇසුරෙන් ලියන්න.

iii) $r$ සමග ධ්වනි තීව්‍රතාවය $I$ හි විචලනය ප්‍රස්තාරගත කරන්න.

iv) ධ්වනි තීව්‍රතා මට්ටම $\beta$ සඳහා ප්‍රකාශනයක් ධ්වනි තීව්‍රතාවය $I$ සහ ශ්‍රව්‍යතා දේහලීය $I_0$ ඇසුරින් ලියන්න.

v) නීරෝගී පුද්ගලයෙකුගේ ශ්‍රව්‍යතා දේහලීය සහ වේදනා දේහලීය අගයන් පිළිවෙලින් $1 \times 10^{-12}\, Wm^{-2}$ සහ $1\, Wm^{-2}$ වේ. ශ්‍රව්‍යතා දේහලීය සහ වේදනා දේහලීයන්ට අනුරූප ධ්වනි තීව්‍රතා මට්ටම් ගණනය කරන්න.




රූපයේ දැක්වෙන්නේ කේන්ද්‍රය $O$ සහ අරය $10\, m$, $20m$ හා $40\, m$ වන කල්පිත ගෝලීය පෘෂ්ඨ 3 කි. $O$ කේන්ද්‍රය පොළව මට්ටමේ සිට $1.5\, m$ පමණ උසින් පවතී. $X_1$, $X_2$ , $X_3$ හා $X_4$ යනු එම කල්පිත පෘෂ්ඨ මත සලකනු ලබන ලක්ෂ්‍ය 4 කි. $P$ නියත ක්ෂමතාවයෙන් යුතු ලක්ෂීය ධ්වනි ප්‍රභවයක් $O$ හි අචලව පිහිටුවා ඇත.

b). $X_1$, $X_2$ , $X_3$ හා $X_4$ ලක්ෂ්‍ය සම්බන්ධව පහත ඒවාට පිළිතුරු සපයන්න.

a) සමාන ධ්වනි තීව්‍රතා පවතින්නේ කවර ලක්ෂ්‍ය වල ද?

b) $X_1$ හි තීව්‍රතාවය, $X_4$ හි තීව්‍රතාවය මෙන් කී ගුණයක් ද? ( $\pi = 3$ ලෙස ගන්න.)

c) $X_3$ හි ධ්වනි තීව්‍රතා මට්ටම $80\, dB$ නම් $X_2$ හා $X_4$ ලක්ෂ්‍ය වලදී ධ්වනි තීව්‍රතා මට්ටම් ගණනය කරන්න. $\log 2 = 0.3$ සලකන්න.

d) $X_3$ හි ධ්වනි තීව්‍රතාව සහ ප්‍රභවයේ ක්ෂමතාව $(P)$ ගණනය කරන්න.

c). ඉහත ප්‍රභවය ඉවත්කර වෙනත් ලක්ෂීය ධ්වනි ප්‍රභවයක් $O$ ලක්ෂ්‍යයේ ස්ථානගත කළවිට $X_3$ ලක්ෂ්‍යයේ නව ධ්වනි තීව්‍රතාවය $10^2\, Wm^{-2}$ විය. ධ්වනි තීව්‍රතා මට්ටම $120\, dB$ හෝ ඊට වැඩිවන විට පුද්ගලයාගේ කනෙහි ආරක්ෂාව සඳහා ශබ්ද අවශෝෂක උපකරණයක් පැළඳිය යුතුය. මෙවැනි ශබ්ද අවශෝෂණ උපකරණයකින් පතිත තීව්‍රතාවයෙන් 99% අවශෝෂණය කරන්නේ යැයි සඳහන් කර ඇත.

i) $X_3$ හි දී නව තීව්‍රතා මට්ටම සොයන්න.

ii) $X_3$ හි දී ඔහු ශබ්ද අවශෝෂක උපකරණයක් පැළඳිය යුතු ද? හේතු දක්වන්න.

iii) $X_3$ හි දී ඔහු ආරක්ෂිත උපකරණය පැළඳියේ නම් කණට ලැබෙන ධ්වනි තීව්‍රතා මට්ටම ගණනය කරන්න.

iv) ආරක්ෂිත උපකරණය නොපැළඳ කණට වේදනාවකින් තොරව ශබ්දය ශ්‍රවණය කිරීමට ප්‍රභවයේ සිට ඔහු සිටිය යුතු අවම දුර සොයන්න.

07. a). දුස්ස්‍රාවී තරල ප්‍රවාහයක් සඳහා වූ පොයිසෙල් සමීකරණය $Q = \frac{\pi r^4 \, \Delta P}{8\eta l}$ මගින් ලබා දේ.

i) මෙම සමීකරණයේ එක් එක් සංකේතය හඳුන්වන්න.

ii) ඉහත සමීකරණය වලංගු වීම සඳහා අවශ්‍ය වන තත්ත්ව ලියන්න.

iii) ඉහත ලියන ලද තත්ත්ව සපුරාලමින් තිරස් නලයක් තුළින් ගලා යන තරල ප්‍රවාහයක ද්‍රව ස්ථර වල ප්‍රවේගයන් වෙනස් වන ආකාරය ඊතල සටහනකින් ඇඳ දක්වන්න. (නලයේ අක්ෂය පැහැදිලිව ඇඳ නම් කරන්න.)

b). විශ්කම්භයන් වෙනස් තිරස් කේෂික නල දෙකක් එකතු කර සෑදූ සංයුක්ත නලයක් පහත රූපයේ දක්වේ. මෙම නලය තුළින් අනවරතව ගලා යන තරල ප්‍රවාහයක් සඳහා $AC$ අක්ෂය ඔස්සේ පීඩනය වෙනස් වන ආකාරය ප්‍රස්තාරගත කරන්න.




c). නලයක දිග $1\,km$ වන අතර එහි අභ්‍යන්තර විෂ්කම්භය $20\,cm$ කි. මෙම නලය තුළින් දුස්ස්‍රාවිතාව $0.9\,Ns\,m^{-2}$ වන තෙල් ප්‍රවාහයක් ගලා යන සාමාන්‍ය වේගය $1.0\,m\,s^{-1}$ වේ.

i) එවිට නලයේ දෙකෙළවර පවත්වාගත යුතු පීඩන අන්තරය ගණනය කරන්න.

ii) එම පීඩන අන්තරය පවත්වා ගැනීම සඳහා නලයේ එක් කෙළවරකින් තෙල් මත යෙදිය යුතු බලයේ සාමාන්‍ය අගය සොයන්න. ( $\pi = 3$ ලෙස ගන්න.)

iii) ඉහත සාමාන්‍ය වේගය පවත්වාගෙන යාම සඳහා තෙල් ප්‍රවාහයට ලබා දිය යුතු ජවය (ක්ෂමතාවය) කොපමණ ද?

iv) නලයේ අරය ඉහත සඳහන් අගයට වඩා අඩු වූයේ නම් පෙර සඳහන් සීඝ්‍රතාවයෙන්ම තෙල් ප්‍රවාහය පවත්වා ගැනීම සඳහා යෙදිය යුතු ජවය ඉහත අගයට වඩා අඩු වේ ද? වැඩිවේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

d). ඉහත තෙල් ප්‍රවාහන නලය පහත රූපයේ පරිදි දිගින් සමාන හා අභ්‍යන්තර අරය අර්ධයක් වූ තවත් නලයක් සමඟ සම්බන්ධ කර ඇත. නියත ප්‍රවාහ සීඝ්‍රතාවයක් පවත්වා ගැනීම සඳහා $A$ හා $C$ දෙකෙළවර අතර පීඩන අන්තරය, $A$ හා $B$ අතර පීඩන අන්තරය මෙන් කොපමණ ප්‍රමාණයකින් විශාල විය යුතු ද?



08. විශ්වය ගවේෂණය කිරීම සඳහා නාසා ($NASA$) අභ්‍යවකාශ පර්යේෂණ ආයතනය විවිධ විශ්ව ගවේෂණ මෙහෙයුම් යොදා ගනී. ක්ෂීරපථයේ ඇති අනෙකුත් ග්‍රහ වස්තු පද්ධති සහ තාරකාවන් පිළිබඳ ගවේෂණය කිරීම සඳහා පෘථිවිය වටා කක්ෂයක ගමන් කරන අභ්‍යවකාශ පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවා ඇත. ඒවා කරා ගගනගාමීන් ගෙන යාමට අභ්‍යවකාශ ෂටලයන් යොදා ගනී. තව ද ගගනගාමීන් රහිත යානා යොදා ගනිමින් අඟහරු ග්‍රහයා වැනි ග්‍රහවස්තු පිළිබඳ ගවේෂණයන් සිදු කරයි. මේ වන විට නාසා ආයතනයේ "පර්සිවියරන්ස් රෝවරය" ද අඟහරු ග්‍රහයා පිළිබඳ නවතම තොරතුරු අනාවරණය කර ගනිමින් සිටී. ග්‍රහලෝක ඒකාකාර ගෝලීය වස්තු යැයි ද, ඒවා සූර්යයා වටා වෘත්තාකාර පථවල ගමන් කරන්නේ යැයි ද සූර්යයාගේ බලපෑම නොගිනිය හැකි තරම් යයි ද උපකල්පනය කරන්න. ග්‍රහලෝක අතර ආකර්ෂණය ද වාත ප්‍රතිරෝධය ද නොසලකා හරින්න.

a). i). පෘථිවියේ ස්කන්ධය $M_0$ ද, අරය $R_0$ ද සර්වත්‍ර ගුරුත්වාකර්ෂණ නියතය $G$ ද ලෙස සලකා, පෘථිවි පෘෂ්ඨය මත පිහිටි ලක්ෂ්‍යයක, ගුරුත්ව ක්ෂේත්‍ර තීව්‍රතාව ($g$) සහ ගුරුත්වජ විභවය ($V_0$) සඳහා ප්‍රකාශන ලියන්න.

ii). වස්තුවක් පෘථිවියේ ගුරුත්වාකර්ෂණයෙන් මිදී ගමන් කිරීම සඳහා පෘථිවි පෘෂ්ඨය මත සිට ප්‍රක්ෂේපණය කළයුතු අවම ප්‍රවේගය $V_s$ නම්, $V_s$ සඳහා ප්‍රකාශනයක් ඉහත $V_0$ හි විශාලත්වය ඇසුරෙන් ලබාගන්න.

iii). අඟහරු ග්‍රහයාගේ ස්කන්ධය $M$ ද, අරය $R$ ද යයි සලකා, අඟහරුගේ පෘෂ්ඨය මත දී ගුරුත්වජ ත්වරණය $g_m$ සඳහා ප්‍රකාශනයක් $g,\ M_0,\ R_0\ ,M$ සහ $R$ ඇසුරෙන් ලබාගන්න.

iv). ඉහත අඟහරු ග්‍රහයාගේ පෘෂ්ඨය මත ගොඩබස්සවන ලද රෝවරයේ ස්කන්ධය $m$ නම් රෝවරය සතු ගුරුත්ව විභව ශක්තිය සඳහා ප්‍රකාශනයක් ලියන්න.

b). ස්කන්ධය $m_0$ වූ අභ්‍යවකාශ ෂටලයක් අඟහරු ග්‍රහයා වටා අරය $r$ වූ වෘත්තාකාර කක්ෂයක ගමන් කරයි. පහත ගණනය කිරීම් සඳහා අඟහරුගේ ගුරුත්වාකර්ෂණ බලපෑම පමණක් සලකන්න.

i). එම ෂටලයේ වේගය $v$ සඳහා ප්‍රකාශනයක් ලබා ගන්න.

ii). එම කක්ෂයේ දී ෂටලයේ ආවර්ත කාලය $T$ එහි ස්කන්ධයෙන් ස්වායත්ත බව පෙන්වන්න.

iii). එම කක්ෂයේ ගමන් කරන අභ්‍යවකාශ ෂටලය සතු මුළු යාන්ත්‍රික ශක්තිය සඳහා ප්‍රකාශනයක් $g, M\ , M_0, R_0, r, m_0$ මගින් ලබා ගන්න.

iv). ස්කන්ධය $m$ වූ රෝවරය කක්ෂයේ ගමන් කරන ෂටලයේ සිට අඟහරු පෘෂ්ඨය මත නිශ්චලතාවයෙන් ගොඩ බස්සවනු ලැබේ. මේ සඳහා අඟහරු ග්‍රහයාගේ ගුරුත්වාකර්ෂණයට එරෙහිව සිදුකළ කාර්යය සොයන්න.

v). රෝවරය අඟහරු පෘෂ්ඨයේ සිට නැවත ෂටලය කරා පැමිණීමට එය අඟහරු පෘෂ්ඨයෙන් ප්‍රක්ෂේපණය විය යුතු ප්‍රවේගය සොයන්න.

**09. (A) කොටසට හෝ (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.**

**(A) කොටස**

a). මෝටර් රථයක බැටරියෙහි විද්‍යුත්ගාමක බලය $12\,V$ වේ. මෝටර් රථය පණගැන්වීමේ දී බැටරිය මගින් ක්‍රියාරම්භක මෝටරයට $(starter\ morter)$ $50\,A$ ධාරාවක් සපයනු ලබන අතර එවිට බැටරියෙහි අග්‍ර අතර විභව අන්තරය $10.8\,V$ දක්වා අඩුවේ. (1 රූපය)

i). බැටරියෙහි විද්‍යුත්ගාමක බලය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

ii). බැටරියෙහි අභ්‍යන්තර ප්‍රතිරෝධය ගණනය කරන්න.

iii). මෝටරයේ ප්‍රතිරෝධය ගණනය කරන්න.

iv). බැටරියෙහි අග්‍ර ලුහුවත් කළහොත් එතුලින් ගලන ධාරාව කොපමණ ද?




1 රූපය

b). මෝටර් රථය ඉන්ධන පිරවුම්හලක නවතා එන්ජිම ක්‍රියා විරහිත කර ඉන්ධන පිරවීමේ දී බැටරිය සමග සම්බන්ධව පවතිනුයේ ඉන්ධන ටැංකිය සහ ඉන්ධන ප්‍රමාණය දක්වන දර්ශකය (ඉන්ධන මාපකය) පමණි. (2 රූපයේ පරිදි ) ඉන්ධන ටැංකිය විචල්‍ය ප්‍රතිරෝධයකින් යුක්ත වන අතර ටැංකිය හිස්ව පවතින විට විචල්‍ය ප්‍රතිරෝධයෙහි අගය $140\,\Omega$ ද, ටැංකිය ඉන්ධන වලින් පිරුණ විට විචල්‍ය ප්‍රතිරෝධයෙහි අගය $20\,\Omega$ ද වේ. ඉන්ධන මාපකයේ ප්‍රතිරෝධය $10\,\Omega$ වේ.

බැටරියෙහි අභ්‍යන්තර ප්‍රතිරෝධය නොසලකා හැර පහත එක් එක් අවස්ථා වලදී බැටරි මගින් ලබාදෙන ධාරාව සොයන්න.

i). ඉන්ධන ටැංකිය හිස්ව පවතින විට.

ii). ඉන්ධන ටැංකිය පිරී ඇති විට.




2 රූපය

c). ඉහත බැටරිය සම්පූර්ණයෙන්ම විසර්ජනය වූ පසු එය $2.5\,A$ ධාරාවක් මගින් පැය $20$ ක් තුල දී සම්පූර්ණයෙන්ම ආරෝපණය කළ හැකිය.

i). බැටරිය ශක්තිය ගබඩා කරගන්නා ක්ෂමතාව සොයන්න.

ii). බැටරිය ගබඩා කර ගන්නා මුළු ශක්තිය සොයන්න.

iii). බැටරිය ගබඩා කරගත් ආරෝපණ ප්‍රමාණය සොයන්න.

iv). $50\,A$ ධාරාවක් පිටතට ලබාදීම සඳහා එම ආරෝපණ ප්‍රමාණය කෙතරම් කාලයකට ප්‍රමාණවත් වේ ද? (පිළිතුර පැය වලින් ප්‍රකාශ කරන්න.)




3 රූපය

**(B) කොටස**

a). i). තාත්වික ඩයෝඩයක හා පරිපූර්ණ ඩයෝඩයක $V - I$ ලාක්ෂණික වක්‍ර වෙන වෙනම ඇඳ පෙන්වන්න.

ii). ඩයෝඩයක් ස්විචයක් ලෙස භාවිත කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

b). අවකර පරිණාමකයක් උච්ඡ වෝල්ටීයතාවය $240\,V$ සහ සංඛ්‍යාතය $50\,Hz$ වූ ජව සැපයුමකින් $18\,V$ (උච්ච අගය ) ප්‍රතිදාන වෝල්ටීයතාවයක් ලබාදෙයි.

i). ඉහත ප්‍රතිදාන වෝල්ටීයතාව අර්ධතරංග ඍජුකරණය සඳහා අදාළ පරිපථ සටහනක් අඳින්න.

ii). ඉහත පරිපථයේ ප්‍රදාන වෝල්ටීයතාව හා අර්ධ තරංග ඍජුකරණයෙන් පසු ප්‍රතිදාන වෝල්ටීයතාව නිරූපණය වන ප්‍රස්තාර ඇඳ දක්වන්න.

iii). ප්‍රස්තාරයේ අක්ෂ සලකුණු කර උච්ච වෝල්ටීයතාවයන් හා ආවර්ත කාල අගයන් පැහැදිලිව ලකුණු කරන්න.

iv). ඉහත ඍජුකාරක පරිපථයේ සිලිකන් දියෝඩයක් භාවිත කර ඇත්නම් පහත ඒවා සඳහා පිළිතුරු සපයන්න.

1. පරිණාමකයේ ප්‍රතිදාන වෝල්ටීයතාවය කුමක් ද?
2. ඍජුකාරක ප්‍රතිදාන වෝල්ටීයතාවය කුමක් ද?

v). ඉහත b) i) කොටස යටතේ අඳින ලද පරිපථයට සුමටන ධාරිත්‍රකයක් සම්බන්ධ කරන ආකාරය වෙනම පරිපථ සටහනක ඇඳ පෙන්වන්න. (අවකර පරිණාමකය ඇඳීම අවශ්‍ය නොවේ.)

vi). ඉහත v) කොටසේ පරිපථයේ ප්‍රතිදාන වෝල්ටීයතා යාමනය කිරීම සඳහා නිවැරදි උපාංගය සුදුසු පරිදි යොදා පරිපථ සටහන සම්පූර්ණ කරන්න.

vii). සුමටන ධාරිත්‍රකය සඳහා කුඩා ධාරිතාවක් වෙනුවට විශාල ධාරිතාවක් භාවිත කිරීමේ වාසිය කුමක් ද?

viii). යාමනය කිරීම සඳහා යොදන උපාංගයේ වෝල්ටීයතාව $15\,V$ හා ඒ තුළින් ගලන උපරිම ධාරාව $200\,mA$ නම් පරිපථයට යෙදිය යුතු ආරක්ෂක ප්‍රතිරෝධයේ අවම අගය සොයා එම ප්‍රතිරෝධය ඉහත iv) කොටසෙහි පරිපථ සටහනේම සුදුසු පරිදි අඳින්න.

**10. (A) කොටසට හෝ (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.**

**(A) කොටස**

a). i). බොයිල් නියමය හා චාල්ස් නියමය සඳහන් කර එමගින් පරිපූර්ණ වායු සමීකරණය ලබා ගන්න.

ii). රූපයේ දැක්වෙන පරිදි හරස්කඩ වර්ගඵලය $50\ cm^2$ වූ සිරස් සිලින්ඩරාකාර ටැංකියක ඉහළ කෙළවර සිරස් තන්තුවකින් එල්වා නිශ්චලතාවයේ තබා ඇති ස්කන්ධය $10\ kg$ වූ පිස්ටනයකින් වසා ඇත්තේ ටැංකියෙහි සංවෘත කොටසේ උස $2\ m$ වන පරිදිය. කාමර උෂ්ණත්වයේ දී $(27^0 C)$ ටැංකිය හයිඩ්‍රජන් ඔක්සිජන් හා නයිට්‍රජන් වලින් සමන්විත වායු මිශ්‍රණයකින් පුරවා ඇත්තේ ඒවායේ ස්කන්ධ වෙන වෙනම පිළිවෙලින් $2.1 \times 10^4\ Nm^{-2}$ ක පීඩනයක දී $0.01\ m^3$ පරිමාවක් ද, $1 \times 10^4\ Nm^{-2}$ ක පීඩනයක දී $0.024\ m^3$ පරිමාවක් ද $3 \times 10^4\ Nm^{-2}$ පීඩනයක දී $0.02\ m^3$ පරිමාවක් ද වසා සිටින පරිදිය. ඉහත සඳහන් අගයන් දී ඇත්තේ කාමර උෂ්ණත්වයේ දී නම්,



1. වායු තුනෙහි ආංශික පීඩනයන් ද?
2. මෙම වායු මිශ්‍රණයෙහි මුළු පීඩනය ද ගණනය කරන්න.
3. ඔබ මුළු පීඩනය සෙවීමට භාවිතා කළ මූලධර්මය කුමක් ද? එය ලියා දක්වන්න.

iii). හයිඩ්‍රජන්, ඔක්සිජන් හා නයිට්‍රජන් වල අණුක භාර පිළිවෙලින් $2,\ 32$ සහ $28$ වේ නම් වායු මිශ්‍රණයේ මුළු ස්කන්ධය ගණනය කරන්න.

iv). තන්තුව යන්තමින් බුරුල් වන තෙක් වායු මිශ්‍රණය රත් කරන්නේ නම්, ටැංකියෙන් වායුව පිට නොවන්නේ යැයි උපකල්පනය කරමින් එම අවස්ථාවේ දී වායු මිශ්‍රණයෙහි උෂ්ණත්වය ගණනය කරන්න.

b). ඉහත වායු පද්ධතියේ පීඩනයේම පවත්වා ගනිමින් පද්ධතියට $100\ J$ තාප ප්‍රමාණයක් ඇතුලු කිරීම නිසා පිස්ටනය $4\ cm$ කින් ඉහල යයි.

i). තාපගති විද්‍යාවේ එන පළමු නියමය ප්‍රකාශනයක ආකාරයෙන් ලියා එහි පද හඳුන්වන්න.

ii). මෙහි දී සිදුවන කාර්යය ප්‍රමාණය කොපමණ ද?

iii). වායු පද්ධතියේ අභ්‍යන්තර ශක්ති වෙනස සොයන්න.

iv). පද්ධතියේ උෂ්ණත්ව වෙනස අඩු වේ ද? වැඩි වේ ද? ඔබේ පිළිතුර පැහැදිළි කරන්න.

v). පිස්ටනය ඉහළ යාමට ඉඩ නො දී අචලව තබාගනිමින් $100\ J$ ක තාප ප්‍රමාණයක් වායු පද්ධතියට ලබා දුන්නේ නම් අභ්‍යන්තර ශක්ති වෙනස කොපමණ ද?

vi). ඉහත වායු පද්ධතිය සමෝෂ්ණ හා ස්ථිරතාපී ක්‍රියාවලි සඳහා භාජනය වූ යේ නම් ඊට අදාළ පීඩන$(P)$ $-$ පරිමා$(V)$ ප්‍රස්තාරවල දළ සටහන් ඇඳ ඒවා නම් කරන්න.

(වායුගෝලීය පීඩනය $1.0 \times 10^5\ Nm^{-2}$ සහ $R = 8.3\ JK^{-1}\ mol^{-1}$ )

## (B) කොටස

a). $\alpha, \beta$ අංශුන් හා $\gamma$ කිරණ ස්වයංසිද්ධ විමෝචනය මගින් අස්ථායි න්‍යෂ්ටි, ස්ථායි න්‍යෂ්ටි බවට පත් වීමේ ක්‍රියාව විකිරණශීලීතාවය ලෙස හඳුන්වයි.

i). ${}^{A}_{Z}X$ නම් විකිරණශීලී මාතෘ න්‍යෂ්ටියක් එක් $\alpha$ ක්ෂයවීමකට භාජනය වී $Y$ නම් දුහිතෘ න්‍යෂ්ටියක් සෑදේ නම් ඊට අදාළ න්‍යෂ්ටික ප්‍රතික්‍රියාව ලියන්න.

ii). පහත න්‍යෂ්ටික ප්‍රතික්‍රියා පිළිතුරු පත්‍රයේ සටහන් කර සම්පූර්ණ කරන්න.

1. ${}^{14}_{6}C \longrightarrow {}^{14}_{7}N + \ldots\ldots\ldots + \overline{\upsilon_e}$
2. ${}^{23}_{11}Na \longrightarrow {}^{\ldots}_{\ldots}Ne + \beta^{+} + \upsilon_e$
3. ${}^{12}_{5}B \longrightarrow {}^{12}_{6}C^{*} + \ldots\ldots\ldots + \overline{\upsilon_e}$
4. ${}^{12}_{6}C^{*} \longrightarrow {}^{14}_{6}C + \ldots\ldots\ldots +$ ශක්තිය

iii). $\beta^{+}, \beta^{-}$ හා $\alpha$ මගින් නිරූපිත අංශු ලියා දක්වන්න.

iv). ඉහත i) a) හි විමෝචනය වන $\alpha$ අංශුවේ ගම්‍යතාවය ධන $x$ දිශාවට $p$ විට දුහිතෘ න්‍යෂ්ටියේ ගම්‍යතාවයේ විශාලත්වය හා දිශාව සොයන්න.

v). න්‍යෂ්ටික විමෝචන ප්‍රතික්‍රියාවක විමෝචනය වන ශක්තිය $4.6\ MeV$ නම් එම ශක්තිය ජූල් වලින් සොයන්න. (ඉලෙක්ට්‍රෝනයේ ආරෝපණය$= 1.6 \times 10^{-19}\ C$ )

b). විකිරණශීලී නියැදියක සක්‍රීයතාව $A = \lambda N$ මගින් දෙනු ලැබේ. එහි $\lambda$ යනු විකිරණශීලී ක්ෂය නියතය වන අතර $N$ යනු එම මොහොතේ අස්ථායි න්‍යෂ්ටි සංඛ්‍යාව වේ. $\lambda = \frac{0.7}{T}$ වන අතර $T$ අර්ධ ආයු කාලයයි.

i). සක්‍රීයතාවය අර්ථ දක්වා එහි $SI$ ඒකකය ලියන්න.

ii). ක්ෂය නියතයේ මාන ලියා දක්වන්න.

iii). අර්ධ ආයු කාලය අර්ථ දක්වන්න.

iv). විකිරණශීලී නියැදියක ආරම්භක සක්‍රීයතාවය නම් එහි සක්‍රීයතාවය $A_0$ නම් අර්ධ ආයු කාලය හා සක්‍රීයතාවය දක්වමින් එහි සක්‍රීයතාවය කාලය සමඟ වෙනස්වන ආකාරය ප්‍රස්තාර ගත කරන්න.

v). ක්‍රිප්ටෝන් ${}^{87}_{36}Kr$ විකිරණශීලී මූලද්‍රව්‍යයෙන් අර්ධ ආයු කාලය මිනිත්තු 70 කි.

1. මෙම මූලද්‍රව්‍යයේ $8.7\ \mu g$ ඇති පරමාණු ගණන සොයන්න.
2. ක්ෂය නියතය (මිනිත්තුවට ඒකකයෙන්) ගණනය කරන්න.
3. $8.7\ \mu g$ ප්‍රමාණයක සක්‍රීයතාවය $SI$ ඒකකයෙන් ගණනය කරන්න.

c). සූර්යයාගේ අභ්‍යන්තරයේ සිදුවන හයිඩ්‍රජන් න්‍යෂ්ටි හීලියම් න්‍යෂ්ටි බවට පත්වීමේ න්‍යෂ්ටික විලයන ප්‍රතික්‍රියා නිසා සූර්ය පෘෂ්ඨයේ සාමාන්‍ය උෂ්ණත්වය $6000\ K$ ක් වේ. මෙම අධික උෂ්ණත්වය නිසා පුළුල් පරාසයක වූ විකිරණ සූරයයාගෙන් විමෝචනය වේ.

i). සූර්යයාගේ අභ්‍යන්තරයේ සිදුවන න්‍යෂ්ටික විලයන ප්‍රතික්‍රියාව ලියා දක්වන්න.

ii). පූර්ණ කෘෂ්ණ වස්තුවක් සඳහා ස්ටෙ ාන් නියමය ප්‍රකාශනයක ආකාරයෙන් ලියා එහි සංකේත හඳුන්වන්න.

iii). සූර්යයා පූර්ණ කෘෂ්ණ වස්තුවක් සේ සලකා සූර්ය පෘෂ්ඨයෙන් විකිරණ විමෝචනය වීමේ තීව්‍රතාවය සොයන්න.
( $6^4 = 1296$ සහ $\sigma = 6 \times 10^{-8}\ Wm^{-2}\ K^{-4}$ ලෙස ගන්න.)

iv). සූර්යයාගේ පෘෂ්ඨයෙන් විමෝචනය වන මුළු ශක්තියෙන් $10\%$ ක් පාර ජම්බුල $(UV)$ පරාසයේ පවතී. සූර්යයාගේ පෘෂ්ඨයෙන් පාරජම්බුල විකිරණ ශක්තිය නිකුත්වන සීඝ්‍රතාවය සොයන්න.
(සූර්යයාගේ මධ්‍යන්‍ය අරය $1 \times 10^6\ km$ වේ.)

* * *